ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>ඉන්දියානු නාවික හමුදාව සහ ශ්‍රී ලංකා නාවික හමුදාව අතර **SLINEX** – 2025 සමුද්‍රීය අභ්‍යාසය ඇරඹේ</u>

ඉන්දියානු නාවික හමුදාව සහ ශ්‍රී ලංකා නාවික හමුදාව අතර වාර්ෂික ද්විපාර්ශ්වික සමුද්‍රීය අභ්‍යාසය වන SLINEX – 2025 12 වන වරටත් අගෝස්තු 12-18 දිනවල කොළඹ දී පැවැත්වීමට නියමිතය. මෙම අභ්‍යාසය අදියර දෙකකින් ක්‍රියාත්මක කෙරෙනු ඇත. ඒ අනුව 2025 අගෝස්තු 14-16 දක්වා කොළඹ දී වරාය අදියර ද අගෝස්තු 17-18 අතර කොළඹට ඔබ්බෙන් මුහුදු අදියර ද පැවැත්වෙනු ඇත. INS ජ්‍යෝති (Fleet Tanker) සහ INS රාණා (Destroyer) විසින් ඉන්දියානු නාවික හමුදාව ද SLNS විජයබාහු (Advance Offshore Patrol Vessel) සහ SLNS සයුර (OPV) විසින් ශ්‍රී ලංකා නාවික හමුදාව ද නියෝජනය කරනු ඇත. මෙයට අමතරව, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ BEL 412 හෙලිකොප්ටර් ද අභ්‍යාසය සඳහා සහභාගී වනු ඇත. ඉන්දීය නාවික හමුදාව සහ ශ්‍රී ලංකා නාවික හමුදාව අතර විශේෂ බලකා අභ්‍යාසය සඳහා දෙරට නාවික හමුදාවන්ගේ විශේෂ බලකායන් ද සහභාගී වනු ඇත. පසුගිය වසරේ 11 වන SLINEX අභ්‍යාසය 2024 දෙසැම්බර් 17-20 දිනවල විශාඛපට්ටනම් හි සිදු කරන ලදී.

2. SLINEX – 2025 අභ්‍යාසයේ අරමුණ වන්නේ දෙරට නාවික හමුදාවන් අතර කාර්ය සහයෝගීතාවය වැඩි දියුණු කිරීම, අන්‍යෝන්‍ය අවබෝධය ඉහළ නැංවීම සහ විවිධ පැතිකඩවලින් සමන්විත සමුද්‍රීය මෙහෙයුම් හි මනා පිළිවෙත්/ක්‍රියාදාමයන් හුවමාරු කර ගැනීමයි. එකිනෙකාගෙන් ඉගෙන ගැනීමට නාවික හමුදා සාමාජිකයන්ට අවස්ථාව ලබා දෙමින්, බෙදාහදා ගන්නා වටිනාකම් සවිමත් කරමින් සහ මිත්‍රත්වයේ සහ

සහෝදරත්වයේ බැඳීම් ගොඩනගමින් ක්‍රීඩා වැඩසටහන්, යෝගා සැසි සහ සංස්කෘතික වැඩසටහන් ද වරාය අදියරට ඇතුළත් වනු ඇත. ශ්‍රී ලංකා නාවික හමුදාවේ මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් රියර් අද්මිරාල් බී. ලියනගමගේ, INS ජ්‍යෝති නෞකාවේ අණදෙන නිලධාරී කපිතාන් චේතන් ආර්. උපාධ්‍යයා සහ INS රානා නෞකාවේ අණදෙන නිලධාරී කපිතාන් කේ.පී. ශ්‍රීසාන් සහ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කපිතාන් ආනන්ද් මුකුන්දන් යන මහත්වරු SLINEX - 2025 සමාරම්භක උත්සවයට සහභාගී වනු ඇත.

3. වරාය පුහුණු ක්‍රියාකාරකම්, SLINEX අන්තර්ක්‍රියා සහ HARD සිමියුලේටරයේ පුහුණු වීම් ද SLINEX – 2025 අභ්‍යාසය අතරතුර පැවැත්වෙනු ඇත. ගොඩබිම ඉලක්කයන්ට වෙඩි තැබීම, උපායමාර්ගික පියවර, විශේෂ නාවික කුසලතා සහ දැනුම ගොඩනැංවීමේ පුහුණු, cross deck flying ඇතුළු හෙලිකොප්ටර් මෙහෙයුම්, සෙවීම් සහ මුදවා ගැනීම් සහ මුහුදේ සිදු කරන විශේෂ බලකා මෙහෙයුම් වැනි විවිධ අංශවල අභ්‍යාසයන් මුහුදු අදියරට ඇතුළත් වනු ඇත. මෙම ක්‍රියාකාරකම් මිත්‍රශීලී නාවික හමුදා දෙක අතර දැනටමත් පවතින ඉහළ මට්ටමේ කාර්ය සහයෝගීතාවය තවදුරටත් ඉහළ නංවනු ඇත.

4. ඉන්දීය නාවික හමුදාව මෙයට පෙර බදු පදනම මත ඩෝනියර් සමුද්‍රීය නිරීක්ෂණ ගුවන් යානයක් ලබා දී ඇත. පසුගිය වසර තුන තුළ මෙම ගුවන් යානය ශ්‍රී ලංකාවේ සමුද්‍රීය නිරීක්ෂණ හැකියාව ඉහළ නංවා ඇත. සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව මෙම ගුවන් යානය මෑතක දී ඉන්දියාව බලා පිටත් විය. ඉන්දීය නාවික හමුදාවේ රානා නෞකාව ද SLINEX – 2025 අභ්‍යාසය සඳහා කොළඹට පැමිණීමට පෙර ඩෝනියර් ගොඩබිම් සහය උපකරණ සහ අමතර කොටස් ඉවත් කර ගැනීම සඳහා ත්‍රිකුණාමලයට යාත්‍රා කර ඇත.

5. SLINEX අභ්‍යාස මාලාව ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ගැඹුරු නියැළීම පිළිබිඹු කරන අතර එය සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ අන්‍යෝන්‍ය සහයෝගීතාවය ශක්තිමත් කර ඇත. ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ඉන්දීය නාවික හමුදාව අතර අන්තර් ක්‍රියා ද ඉන්දියාවේ 'අසල්වැසියා ප්‍රථමයනේ' යන ප්‍රතිපත්තිය සහ 'කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය' (SAGAR) යන දැක්ම අනුව පසුගිය වසර කිහිපය තුළ සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත.

***

කොළඹ
*2025 අගෝස්තු 12*